**මහජන උපයෝගිතා කොමිෂන් සභාව - 2012**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

විගණනයේ ගණන් බැලීම්වලට අනුව සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂිත වෙන් කිරීම රු.2,080,272 ක් වුවද, එය රු.1,749,232 ක් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් පාරිතෝෂිත වෙන් කිරීම රු.331,040 ක් අඩුවෙන්ද, වර්ෂයේ ලාභය රු.331,040 ක් වැඩියෙන්ද ගිණුම් ගත කර තිබුණි.

**1.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්**

පරිගණක හා කාර්යාල උපකරණ, ලී බඩු හා සවිකිරීම් හා මෘදුකාංග යන ස්ථාවර වත්කම් විෂයයන් තුනක් සම්බන්ධයෙන් 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල හා ස්ථාවර වත්කම් උපලේඛනය අතර පිලිවෙලින් රු.892,519 ක්ද, රු.2,009,952 ක්ද හා රු.92,822 ක්ද වෙනසක් නිරීක්ෂණය විය.

**1.2.3 නීති, රීති හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 අංක 10 දරන දේශිය ආදායම් පනතේ 120 (අ) වගන්තිය | උපයන විට ගෙවීම් බදු රු.546,440 ක් ඊලඟ මාසයේ 15 දින වන විට දේශිය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරිමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාසි 341 | ආදායම් රැස් කිරිම සඳහා භාවිතා කරන කුවිතාන්සි පොත් සඳහා උප පත්‍රිකා පොත් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) | මු.රෙ.387 | 2012 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය ඉක්මවා එකතුව රු. 1,437,745 ක වෙක් පත් නිකුත් කර තිබුණි. |
| (ඈ) | මු.රෙ.756 (5) | 2012 වර්ෂය සඳහා නියමිත ආකෘති පත්‍ර භාවිතා කරමින් භාණ්ඩ සමීක්ෂණය විධිමත් ලෙස සිදු කර නොතිබුණි. |
| (ඉ) | 2000 ජනවාරි 31 දිනැති අංක පීඑෆ්/පීඊ/6 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 24 ඡේදය | ඉකුත් වර්ෂවලදි මෙන්ම සමාලෝචිත වර්ෂයේදිද සේවකයින් විසින් ගෙවිය යුතු එකතුව රු.665,579 ක්වූ උපයන විට ගෙවීම් බදු කොමිෂන් සභාවේ අරමුදලෙන් ගෙවා තිබුණි. |
| (ඊ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑෆ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා උපාංග ලේඛනය නිසි පරිදි යාවත්කාලින කර නොතිබුණි. |

**1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු පහත සඳහන් ගනුදෙනු සඳහා දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් වී නොතිබුණි.

(අ) කොමිෂන් සභාව විසින් 2012 වර්ෂයට ගිණුම් ගත කර තිබූ රු.160,470,441 ක වටිනාකමින් යුතු ජර්නල් සටහන් 234 ක් සඳහා විධිමත් අනුමැතියකින් යුතු මූලාශ්‍ර ලියවිලි ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විදේශ ගමන් සහ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ නිලධාරින්ට සංයුක්ත හා අනියම් දීමනා ගෙවීමේදී වවුචරයන්හි ගමන් විස්තර, ගමන සඳහා ගතවූ කාලය හා රේටයන් ගණනය, ගුවන් ගමන් විස්තර, විදේශ අනුග්‍රහයන් ලබාදීම ආදි විස්තර කිසිවක් ඇතුළත් නොකර ගෙවන ලද මුළු මුදල පමණක් සඳහන් කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ කොමිෂන් සභාවේ අරමුදල් මෙහෙයුම්වලින් රු.29,967,560 ක වියදම ඉක්මවූ ආදායමේ අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වියදම් ඉක්මවූ ආදායමේ අතිරික්තය රු.55,978,423 ක් වුයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.26,010,863 ක අඩුවීමක් දක්නට ලැබුණි. මෙම අඩුවීම ඉකුත් වර්ෂයට වඩා සමාලෝචිත වර්ෂයේ වියදම රු.47,669,634 කින් වැඩිවීම බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂය සඳහා පිළියෙල කර ඇති ක්‍රියාකාරි සැලැස්මේ ප්‍රධාන කාර්යයන් 7 ක් යටතේ ඉටු කළ යුතු කාර්යයන් 66 ක් පැවතියද 2012 දෙසැම්බර් 31 දින වන විට එම කාර්යයන් 32 ක් කෙරීගෙන යන මට්ටමේ පැවතුණි.

(ආ) 2012 වර්ෂය තුළ කොමිෂමට ලැබුණු මහජන පැමිණිලි 466 ක් අතරින් 425 කට විසඳුම් ලබාදී තිබූ අතර තවත් 41 ක් සම්බන්ධයෙන් 2012 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනතේ 14 (2) (1) වගන්තිය යටතේ වූ විදුලිය, ජලය හා ඛනිජ තෙල් කර්මාන්ත සම්බන්ධයෙන් නියාමන කටයුතු කිරීම සඳහා 2004 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පුනරාවර්තන වියදම් ලෙස රු.356,177,653 ක් හා ප්‍රාග්ධන වියදම් ලෙස රු.61,383,125ක් වැය කර තිබුණි. 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත අනුව විදුලි කර්මාන්තයේ නියාමන කටයුතු 2009 අප්‍රේල් 08 දින සිට කොමිෂන් සභාව ඉටු කරනු ලබන අතර, ජලය හා ඛණිජ තෙල් කර්මාන්තය සම්බන්ධයෙන් අදාල පනත් සංශෝධන අනුමත නොවීම නිසා එම කර්මාන්තවල නියාමන කටයුතු ඉටු කිරීමට නොහැකි වී තිබුණි. නමුත් අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව ලිහිසි තෙල් සම්බන්ධ නියාමන කටයුතු කොමිෂන් සභාවට පැවරී තිබුණි.

(ඈ) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 9 වගන්තිය ප්‍රකාරව මෙ.වො.25 ට වැඩි ධාරිතාවකින් විදුලිය උත්පාදනය කරන 2007 අංක 7 දරන සමාගම් පනත අනුව පිහිටුවා ඇති රජයේ කොටස් ප්‍රාග්ධනය සියයට 50 කට අඩු සමාගම්වලට විදුලිය උත්පාදනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කළ නොහැක. දැනටමත් ධාරිතාවය මෙ.වො.25 ඉක්මවා විදුලිය උත්පාදනය කරන සමාගම් 06 කට බලපත්‍ර නිකුත් කර නොතිබූ අතර, එම සමාගම් විසින් උත්පාදනය කරනු ලබන විදුලිය ශ්‍රී ලංකාවේ විදුලි බල ධාරිතාවයට එක් කර ගෙන තිබුණි. එම තත්ත්වය නිවැරදි කිරීමට 2012 වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. එකී සමාගම් අවශ්‍යතා සපුරා නොමැති බැවින් බලපත්‍ර නිකුත් කිරීමට නොහැකි බව සභාපති දැනුම් දී ඇත.

(ඉ) ලිහිසි තෙල් වෙළඳපල කටයුතු තුළ සමාගම් 14 ක් ලියාපදිංචි වී තිබුණු අතර, ඉන්වොයිස් වටිනාකමෙන් සියයට 0.5 ක විචලා ලියාපදිංචි ගාස්තුවලින් රු.මිලියනය ඉක්මවා ගනුදෙනු කර තිබුණේ සමාගම් 11 ක් පමණි. ඒ අනුව 2012 වර්ෂයේ සමාගම් 11 කින් විචලා ලියාපදිංචි කිරීමේ ගාස්තු ලෙස රු.32,704,473 ක් කොමිෂන් සභාව වෙත ලැබී තිබුණි.

## 3.2 අනාර්ථික ගණුදෙනු

සේවක භාරකාර අරමුදලට (ETF) ගෙවීම් ප්‍රමාද වීම නිසා රු.8,571 ක අධිභාරයක් ගෙවා තිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**---------------------------------------------**

**4.1 විගණන කමිටු**

**------------------**

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2003 ජුනි මස 02 දිනැති අංක පීඊඩී 12 චක්‍රලේඛයේ 7.4.1 ඡේදය අනුව වර්ෂයකට අවම වශයෙන් විගණන කමිටු රැස්වීම් 4 ක් පැවැත්විය යුතු වුවද, 2012 වර්ෂය සඳහා කොමිෂම විසින් පවත්වා තිබුණේ රැස්වීම් 02 ක් පමණි.

**4.2 අයවැය පාලනය**

**-------------------**

**ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීම**

**-------------------------------------**

2012 වර්ෂයේ වියදම් වර්ග 4 ක් සඳහා සලසා තිබු ප්‍රතිපාදන ඉක්මවා රු.1,137,023 ක් වියදම් කර තිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

**-------------------------**

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

(අ) ආයෝජනය කිරීම්

(ආ) ආදායම් පාලනය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය